# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1818/21 - 2013 ජූලි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2013.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත**

මධ්‍යම පළාතේ පළාත් සභාව

**10 වන වගන්තිය යටතේ වූ දැන්වීම**

ඉහත සඳහන් පළාත් සභාව සඳහා, එම පළාත තුළ පිහිටි, මෙහි උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක වලින් මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට යන බව (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම ඡන්ද විමසීමේදී මෙහි උපලේඛනයෙහි I වැනි තීරුවෙහි සඳහන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, මෙහි උපලේඛනයෙහි II වැනි තීරුව යටතේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති පරිදි විය යුතුය.

03. නාමයෝජනා පත්‍ර, 2013 ජූලි මස 25 වැනි දිනයෙන් ආරම්භව 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00ට අවසන් වන නාමයෝජනා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාව තුළදී ඕනෑම අවස්ථාවක, මෙහි උපලේඛනයෙහි III වැනි තීරුවේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානවලදී අදාළ තේරීම්භාර නිලධරයන් විසින් භාර ගනු ලැබේ.

04. ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් තරඟ කිරීමට අදහස් කරන යම් තැනැත්තන්ගෙන් යුතු කණ්ඩායමක් වෙතොත් පනතේ 14 වැනි වගන්තිය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය අනුව, එක් එක් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු. 2,000) බැගින් ගණන් බලන ලද මුදලක් මෙම දැන්වීම් ප්‍රසිද්ධ කරන දිනය හා ඉහත සඳහන් නාමයෝජනා කාල සීමාවේ අවසානයට පෙරාතුව ම වූ දින (එනම් 2013 ජූලි මස 31) මධ්‍යාහ්න 12.00 දක්වා අතර කාලය තුළ දී තේරීම්භාර නිලධරයා වෙත තැන්පත් කළ යුතුය.

05. නියමිත ආකෘතියෙහි වූ නාමයෝජනා පත්‍ර, නාමයෝජනා කාල සීමාව ඉකුත්වීමට පෙර තේරීම්භාර නිලධරයාගෙන් ගාස්තු ගෙවීමක් නොමැතිව ලබා ගත හැකිය.

06. පිළිගත් දේශපාලන පක්ෂ සඳහා අනුමත කරන ලද ලකුණු හා ස්වාධීන කණ්ඩායම් සඳහා අනුමත කරන ලද ලකුණු හා හඳුනා ගැනීමේ අංක 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00 ඉකුත් වූ වහාම තේරීම්භාර නිලධරයන් විසින් ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වෙන් කරදෙනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2013 ජූලි මස 11 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

*උපලේඛනය*

| *I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම* | *II වැනි තීරුව එක් එක් නාම යොජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව* | *III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය* |
|---|---|---|
| මහනුවර | 32 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), මහනුවර |
| මාතලේ | 14 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), මාතලේ |
| නුවරඑළිය | 19 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), නුවරඑළිය |

07 - 779/1

---

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත**

*උතුරු පළාතේ පළාත් සභාව*

**10 වන වගන්තිය යටතේ වූ දැන්වීම**

ඉහත සඳහන් පළාත් සභාව සඳහා, එම පළාත තුළ පිහිටි, මෙහි උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක වලින් මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට යන බව (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම ඡන්ද විමසීමේදී මෙහි උපලේඛනයෙහි I වැනි තීරුවෙහි සඳහන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, මෙහි උපලේඛනයෙහි II වැනි තීරුව යටතේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති පරිදි විය යුතුය.

03. නාමයෝජනා පත්‍ර, 2013 ජූලි මස 25 වැනි දිනයෙන් ආරම්භව 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00ට අවසන් වන නාමයෝජනා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාව තුළදී ඕනෑම අවස්ථාවක, මෙහි උපලේඛනයෙහි III වැනි තීරුවේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානවලදී අදාළ තේරීම්භාර නිලධරයන් විසින් භාර ගනු ලැබේ.

04. ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් තරග කිරීමට අදහස් කරන යම් තැනැත්තන්ගෙන් යුතු කණ්ඩායමක් වෙතොත් පනතේ 14 වැනි වගන්තිය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය අනුව, එක් එක් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු. 2,000) බැගින් ගණන් බලන ලද මුදලක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කරන දිනය හා ඉහත සඳහන් නාමයෝජනා කාල සීමාවේ අවසානයට පෙරාතුවම වූ දින (එනම් 2013 ජූලි මස 31) මධ්‍යාහ්න 12.00 දක්වා අතර කාලය තුළදී තේරීම්භාර නිලධරයා වෙත තැන්පත් කළ යුතුය.

05. නියමිත ආකෘතියෙහි වූ නාමයෝජනා පත්‍ර, නාමයෝජනා කාල සීමාව ඉකුත්වීමට පෙර තේරීම්භාර නිලධරයාගෙන් ගාස්තු ගෙවීමක් නොමැතිව ලබා ගත හැකිය.

06. පිළිගත් දේශපාලන පක්ෂ සඳහා අනුමත කරන ලද ලකුණු හා ස්වාධීන කණ්ඩායම් සඳහා අනුමත කරන ලද ලකුණු හා හඳුනා ගැනීමේ අංක 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00 ඉකුත් වූ වහාම තේරීම්භාර නිලධරයන් විසින් ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වෙන් කරදෙනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2013 ජූලි මස 11 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

*උපලේඛනය*

| *I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම* | *II වැනි තීරුව එක් එක් නාම යොජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව* | *III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය* |
|---|---|---|
| යාපනය | 19 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), යාපනය |
| කිලිනොච්චිය | 07 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), කිලිනොච්චිය |
| මන්නාරම | 08 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), මන්නාරම |
| වවුනියාව | 09 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), වවුනියාව |
| මුලතිව් | 08 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), මුලතිව් |

07 - 779/2

---

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත**

වයඹ පළාතේ පළාත් සභාව

**10 වන වගන්තිය යටතේ වූ දැන්වීම**

ඉහත සඳහන් පළාත් සභාව සඳහා එම පළාත තුළ පිහිටි, උප ලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක වලින් මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට යන බව (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම ඡන්ද විමසීමේදී මෙහි උපලේඛනයෙහි I වැනි තීරුවෙහි සඳහන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, මෙහි උපලේඛනයෙහි II වැනි තීරුව යටතේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති පරිදි විය යුතුය.

03. නාමයෝජනා පත්‍ර, 2013 ජූලි මස 25 වැනි දිනයෙන් ආරම්භව 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00ට අවසන් වන නාමයෝජනා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාව තුළදී ඕනෑම අවස්ථාවක, මෙහි උපලේඛනයෙහි III වැනි තීරුවේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානවලදී අදාළ තේරීම්භාර නිලධරයන් විසින් භාර ගනු ලැබේ.

04. ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් තරග කිරීමට අදහස් කරන යම් තැනැත්තන්ගෙන් යුතු කණ්ඩායමක් වෙතොත් පනතේ 14 වැනි වගන්තිය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය අනුව, එක් එක් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු. 2,000) බැගින් ගණන් බලන ලද මුදලක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කරන දිනය හා ඉහත සඳහන් නාමයෝජනා කාල සීමාවේ අවසානයට පෙරාතුව ම වූ දින (එනම් 2013 ජූලි මස 31) මධ්‍යාහ්න 12.00 දක්වා අතර කාලය තුළ දී තේරීම්භාර නිලධරයා වෙත තැන්පත් කළ යුතුය.

05. නියමිත ආකෘතියෙහි වූ නාමයෝජනා පත්‍ර, නාමයෝජනා කාල සීමාව ඉකුත්වීමට පෙර තේරීම්භාර නිලධරයාගෙන් ගාස්තු ගෙවීමක් නොමැතිව ලබා ගත හැකිය.

06. පිළිගත් දේශපාලන පක්ෂ සඳහා අනුමත කරන ලද ලකුණු හා ස්වාධීන කණ්ඩායම් සඳහා අනුමත කරන ලද ලකුණු හා හඳුනා ගැනීමේ අංක 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00 ඉකුත් වූ වහාම තේරීම්භාර නිලධරයන් විසින් ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වෙන් කරදෙනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2013 ජූලි මස 11 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

*උපලේඛනය*

| *I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම* | *II වැනි තීරුව එක් එක් නාම යොජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව* | *III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය* |
|---|---|---|
| කුරුණෑගල | 37 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), කුරුණෑගල |
| පුත්තලම | 19 | තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), පුත්තලම |

07 - 779/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.